07 FEB 1996

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1995 අංක 23 දරන

# කැලෑ (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1995 නොවැම්බර් මස 15 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1995 නොවැම්බර් මස 17 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය

මිල : රු. 1.50 යි. තැපැල් ගාස්තුව : රු. 2.55

1995 අංක 23 දරන කැලෑ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1995 නොවැම්බර් මස 15 වන දින]

එල්. ඩී.—ඕ. 77/92

**කැලෑ ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

1. මේ පනත 1995 අංක 23 දරන කැලෑ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

451 වන අධිකාරයේ දීර්ඝ නාමය ප්‍රතියෝජනය කිරීම.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) කැලෑ ආඥාපනතේ දීර්ඝ නාමය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන දීර්ඝ නාමය ආදේශ කරනු ලැබේ:—

"වන සම්පත් සංරක්ෂණය කිරීමට, ආරක්ෂා කිරීමට සහ කළමනාකරණය කිරීමට අදාළ නීතිය ඒකාබද්ධ කිරීම සඳහා සහ සංශෝධනය කිරීම සඳහා ද දැව කැපීම සහ දැව සහ වන නිෂ්පාදන ප්‍රවාහනය කිරීම පාලනය කිරීම සඳහා ද ඊට සම්බන්ධ හා ආනුෂංගික කරුණු සඳහා ද වූ ආඥාපනතකි.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියේ "මේ ආඥාපනත යටතේ හෝ 1907 අංක 16 දරන ආඥාපනත මගින් ඉවත් කරනු ලැබූ යම් ප්‍රඥප්තියක් යටතේ" යන වචනවල සිට "එම නියෝග ප්‍රකාශයේ දින සිට එම ඉඩම වෙන් කර තැබීම අවසන් විය යුතු ය." යන වචන දක්වා වූ සියලුම වචන ඉවත් කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියට 3අ, 3ආ, 3ඇ සහ 3ඈ අලුත් වගන්ති ඇතුළත් කිරීම.

4. 3 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒවා ප්‍රධාන ප්‍රඥප්තියේ 3අ, 3ආ, 3ඇ, සහ 3ඈ වගන්ති ලෙස බලාත්මක විය යුතු ය:—

"සංරක්ෂිත වන ප්‍රදේශයක් බව පත් කිරීම.

3අ. (1) අනන්‍ය පරිසර පද්ධතීන් සහ ජාන විද්‍යාත්මක සම්පත් ඇති හෝ විරල සහ ප්‍රදේශයට ආවේණික වන සත්ව සහ වෘක්ෂලතා සහ ක්ෂුද්‍රජීවී විශේෂයක් සහ වඳවීමේ තර්ජනයකට භාජන වූ වර්ග ඇත්තා වූ හෝ ගංගා ලවණීකරණය වීම සහ සිදීයාම වැළැක්වීමෙන්, ප්‍රමාණවත් වර්ෂාපතනය ලැබෙන බවට සහතික කිරීමෙන්, පානය කිරීම සඳහා හෝ බලශක්තිය සඳහා ජලය සපයන ජලාශ සිඳී යාම වැළැක්වීමෙන් සහ ජන ජීවිතයට හානිකර වූ නායයෑම් හා ගිනි ඇවිලීම් වැළැක්වීමෙන් ප්‍රදේශයේ පරිසර විද්‍යාත්

එක තුලනය ඇති කිරීම සඳහා ආරක්ෂා කර ගත යුතු වූ රජයේ ඉඩමක යම් නිශ්චිත ප්‍රදේශයක් හෝ යම් සංරක්ෂිත වනයක් සම්පූර්ණයෙන්ම හෝ එහි යම් නිශ්චිත ප්‍රදේශයක් අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් එම නියමයේ නිශ්චිතව දක්වනු ලැබිය හැකි දිනයක සිට සංරක්ෂිත වනයක් විය යුතු බවට ප්‍රකාශයට පත් කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද නියමයේ නිශ්චිතව දක්වනු ලැබිය හැකි දින සිට සහ එදිනට පසුව එම රජයේ ඉඩම හෝ එම රක්ෂිත වනය සම්පූර්ණයෙන්ම හෝ එහි කොටසක් හෝ සංරක්ෂිත වනයක් විය යුතු අතර, නියම කරනු ලැබිය හැකි කොන්දේසිවලට යටත්ව එය වන සංරක්ෂකවරයාගේ පාලනය යටතේ තිබිය යුතු ය.

3ආ වගන්තිය යටතේ කරන ලද නියමය ප්‍රසිද්ධියට පත් කළ යුතු බව.

3ආ. සංරක්ෂිත වනය පිහිටා තිබෙන්නේ යම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක ද නැතහොත් එවැනි කොට්ඨාසවල ද, අවස්ථාවෝචිත පරිදි එම කොට්ඨාසයේ හෝ කොට්ඨාසවල ප්‍රාදේශීය ලේකම්වරයා හෝ ලේකම්වරුන් විසින්, සංරක්ෂිත වනය ප්‍රකාශයට පත් කරනු ලබන බවට නියමයේ නිශ්චිතව දැක්වෙන දිනයට පෙරාතුව එම සංරක්ෂිත වනයේ යම් කොටසක් පිහිටා ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල සහ ඒ සංරක්ෂිත වනයට ආසන්නතම සෑම නගරයකම හෝ ගමකම :—

(අ) යෝජිත සංරක්ෂිත වනයේ පිහිටීම හා මායිම් හැකිතාක් දුරට නිශ්චිතව දක්වමින් ; සහ

(ආ) යෝජිත සංරක්ෂිත වනය ප්‍රකාශයට පත් කිරීමේ දී ඇතිවන ප්‍රතිඵල පැහැදිලි කරමින්

එම නියමයට ප්‍රමාණවත් ප්‍රසිද්ධියක් ලබාදීම සඳහා අවශ්‍ය සියලු පියවර ගත යුතු ය.

සංරක්ෂිත වනයේ සීමාවන් වෙනස් කිරීම.

3ඇ. (1) අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් යම් සංරක්ෂිත වනයක සීමා වෙනස් කළ බව හෝ සුළු වශයෙන් වෙනස් කළ බව ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ අමාත්‍ය වරයා විසින් සාදන ලද නියමයක් ජනාධිපතිවරයා විසින් අනුමත කර, පාර්ලිමේන්තුව විසින් සම්මත කොට එසේ සම්මත කිරීම පිළිබඳ දැන්වීම ගැසට් පත්‍රයේ පළ කරන තුරු එම නියමය බලාත්මක නොවිය යුතු ය.

වන සංරක්ෂක වරයාගේ සහතිකයක් එහි සඳහන් කරුණු සම්බන්ධයෙන් බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු බව.

3ආ. මේ පනත යටතේ පවරන ලද යම් අපරාධ නඩුවක දී යම් ඉඩමක් පිහිටා ඇත්තේ සංරක්ෂිත වනයක් තුළද යන ප්‍රශ්නය පැන නැගුණ අවස්ථාවක දී, එකී ඉඩම පිහිටා ඇත්තේ සංරක්ෂිත වනයක් තුළ බවට වන සංරක්ෂකවරයාගේ අත්සන යටතේ නිකුත් කරන ලද සහතිකයක් සාක්ෂි වශයෙන් ආවේශ්‍ය කරනු ලැබිය යුතු අතර එය එහි සඳහන් කරුණු සම්බන්ධයෙන් බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. 1966 අංක 13 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය පහත දැක්වෙන පරිදි තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තියේ (ඉ) ඡේදයේ “වන නිෂ්පාදන, හෝ” යන වචන වෙනුවට “වන නිෂ්පාදන” යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එම වගන්තියේ (ඉ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

“(ඉඉ) කොරල් හෝ මොලුස්ක් සිප්පි කටු ලබාගන්නා හෝ මිනිරන්, මැණික් හෝ වෙනත් ඛණිජ ද්‍රව්‍ය සඳහා පොළොව කනින හෝ පතල් හාරන ; හෝ”;

(3) එම වගන්තියේ “වරදකට වරදකරු විය යුතු අතර” යන වචනවල සිට එම වගන්තියේ අවසානය දක්වා ඇති වචන ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන් :—

“වරදකට වරදකරු විය යුතු අතර, එසේ වරදකරු කරනු ලැබීමේ දී මාස හයකට අඩු නොවන හා අවුරුදු හතරකට වැඩි නොවන කාලසීමාවක් සඳහා බන්ධනාගාර ගත කරනු ලැබීමට හෝ රුපියල් දෙදහස් පන්සියයකට නොඅඩු හා රුපියල් විසිපන්දහසකට නොවැඩි දඩයකට

හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු අතර, වරද සිදු කිරීමෙන් සිදු වූ අලාභය වටිනාකමින් රුපියල් විසිපන්දහසකට වැඩිවන අවස්ථාවක දී, පනවන ලද දණ්ඩනයට අමතරව වරද කිරීමෙන් සිදු වූ අලාභයේ වටිනාකමින් දෙගුණයකට සමාන දඩ මුදලකට ද ඔහු යටත් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

6. 1988 අංක 84 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය පහත දැක්වෙන පරිදි තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියෙහි—

(අ) (ඒ) වන ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ඒ) යම් නාම පුවරුවකට හෝ සංඥා පුවරුවකට හෝ යම් බිත්තියකට, කානුවකට, ගංඉවුරකට, වැටකට, කඹුල්ලකට, පීල්ලකට හෝ වෙනත් මායිම් සළකුණකට අලාභ සිදු කරන, එය වෙනස් කරන හෝ ඉවත් කරන ;" ;

(ආ) "අතර මේ උපවගන්තියේ වෙනත් යම් ඡේදයක් යටතේ වූ වරදක් සම්බන්ධයෙන් වූ විට" යන වචනවල සිට එම උපවගන්තියේ අවසානය දක්වා වූ සියලු වචන වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන්—

"අතර මේ උපවගන්තියේ වෙනත් යම් ඡේදයක් යටතේ වූ වරදක් සම්බන්ධයෙන් වූ විට මාස හයකට නොඅඩු හා එක් අවුරුද්දකට නොවැඩි කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් පන්දහසකට නොඅඩු හා රුපියල් පනස් දහසකට නොවැඩි දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම හා දඩය යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතුය. ඊට අමතරව වන්දාන්තරයට කරන ලද අලාභය සඳහා අධිකරණය විසින් තීරණය කරනු ලැබිය හැකි වන්දි මුදලකටද ඔහු යටත් විය යුතුය. එම වන්දි මුදල රුපියල් දෙලක්ෂයකට වැඩි නොවිය යුතු අතර එය ප්‍රදානය කරනු ලැබූ විට සෑම ආකාරයකින්ම දඩ මුදලක් ලෙස සලකනු ලැබිය හැකි අතර එසේ සලකා අයකර ගනු ලැබිය යුතුය." ;

(2) එම වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කිරීමෙන්.

**7.** 7 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 7අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :—

ප්‍රධාන ප්‍රඥප්තියට අලුත් 7අ වගන්තිය ඇතුළත් කිරීම.

"සංරක්ෂිත වනයක දී වරදක් සංයුක්ත වන ක්‍රියා.

7අ. (1) මේ වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව යම් සංරක්ෂිත වනයක දී—

(අ) එයට අනවසරයෙන් ඇතුළුවන හෝ අනවසරයෙන් ඇතුළුවීමට ගවයින්ට ඉඩ දෙන ;

(ආ) යම් ශාකයක්, ගසක් හෝ වෙනත් යම් වන නිෂ්පාදනයක් බිම හෙලන, කපන, ලකුණු කරන, කප්පාදු කරන, පට්ටම් දමන, ඉරන, ස්වරූපය වෙනස් කරන, එකතු කරන හෝ ඉවත් කරන ;

(ඇ) යම් ගසක පොත්ත හෝ කොළ සිතාමතා ඉවත් කරන හෝ අන්‍යාකාරයකින් ගසකට හානි සිදු කරන ;

(ඈ) තණකොළ කපන හෝ ගවයින්ට තණකොළ කවන ;

(ඉ) ජලය අපවිත්‍ර කරන ;

(ඊ) යම් ශාකයක් ඉවත් කරන, උපුටා දමන හෝ විනාශ කරන හෝ ශාකයකට යම් අලාභයක් හෝ හානි සිදු කරන ;

(උ) යම් ශාකයක් විකුණන හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කරන හෝ අර්පණය කරන ;

(ඌ) යම් කුරුල්ලකු හෝ වන සත්වයකු හෝ උරගයකු අල්ලන හෝ ඇල්ලීම සඳහා උගුල් අටවන හෝ ඔවුන්ට හානි සිදු කරන හෝ හිරිහැර කරන ;

(එ) යම් කුරුල්ලකු හෝ වන සත්වයකු හෝ උරගයකු හෝ එම කුරුල්ලාගේ, වන සත්වයාගේ හෝ උරගයාගේ යම් කොටසක් විකුණන හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කරන හෝ අර්පණය කරන ;

(ඒ) යම් කුරුල්ලකුගේ හෝ උරගයකුගේ බිත්තර ලබා ගන්නා හෝ විනාශ කරන නැතහොත් යම් කුරුල්ලකුගේ කූඩුවක් විනාශ කරන ;

(ඔ) යම් තුවක්කුවකින් වෙඩි තබන හෝ යම් වන සතකුට අවහිර වන හෝ අවහිර විය හැකි වෙනත් යම් ක්‍රියාවක් කරන හෝ එවැනි යම් සතකුගේ අභිජනන ස්ථානය කට බාධා සිදුවන හෝ බාධා සිදුවිය හැකි ක්‍රියාවක් සිදු කරන ;

(ඕ) යම් සතකුට හෝ ශාකයකට තුවාල සිදු කිරීමේ හෝ විනාශ කිරීමේ කාර්යය සඳහා පාවිච්චි කළ හැකි යම් උගුලක් හෝ යම් පුපුරන ද්‍රව්‍යයක් හෝ විෂ ද්‍රව්‍ය යක් සන්තකයේ තබා ගන්නා හෝ පාවිච්චි කරන ;

(ක) ස්ථිර හෝ තාවකාලික යම් ගොඩනැගිල්ලක් ඉදි කිරීම හෝ එසේ ඉදි කරන ලද යම් ගොඩනැගිල්ලක පදිංචිව සිටින ;

(ග) යම් ස්ථානයක් එළිකරන හෝ ගල් කඩන හෝ කොරල් හෝ මොලුස්ක් සිප්පි කටු ලබාගන්නා හෝ මිනිරන්, මැණික් හෝ ඛනිජ ද්‍රව්‍ය සඳහා කැනීම් කරන හෝ පතල් හාරන හෝ හුනුගල් හෝ අඟුරු පුළුස්සන හෝ ගල්බෝර ගසන ;

(ච) යම් ගින්නක් දල්වන හෝ දල්වා තබන හෝ ගින්දර රැගෙන යන ;

(ජ) වගා කිරීම හෝ වෙනත් යම් කාර්යයක් සඳහා යම් ඉඩමක් එළි කරන හෝ හාරන ;

(ට) යම් පාරක් තනන ;

(ඩ) යම් බිත්තියක්, කානුවක්, ගං ඉවුරක් වැටක්, කඩුල්ලක්, පීල්ලක්, නාම පුවරු වක් හෝ සංඥා පුවරුවක් හෝ වෙනත් යම් මායිම් සලකුණක්, හානියට පත් කරන, වෙනස් කරන හෝ ඉවත් කර

යම් තැනැත්තෙක් වරදකට වරදකරු වන අතර මේ උපවගන්තියේ (ආ)(ඊ)(ක)(ග)(ච) හෝ (ඩ) ඡේදයට අදාළ වරදක් සම්බන්ධයෙන් වන වි අවුරුදු දෙකකට අඩු නොවන හා අවුරුදු පහක් වැඩි නොවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට ද, මේ උප වගන්තියේ වෙනත් ඡ

ඡේදයක් යටතේ වූ වරදක් සම්බන්ධයෙන් වන විට අවුරුදු එකකට අඩු නොවන හා අවුරුදු පහකට වැඩි නොවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් දසදහසකට නොඅඩු හා රුපියල් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ නිශ්චිතව දැක්වෙන යම් වරදක් සිදු කිරීමට ආධාර කරන සහ අනුබල දෙන හෝ එවැනි වරදක් සිදු කිරීමට කටයුතු සලස්වන යම් තැනැත්තෙක් වරදකට වරදකරු වන අතර, එසේ වරදකරු කරනු ලැබුවහොත් එම වරද සඳහා නිශ්චිතව දක්වා ඇති දඬුවමට ම යටත් විය යුතු ය.

(3) මේ වගන්තියේ (1) වන උප වගන්තියෙහි අන්තර්ගත කිසිවකින්, සංරක්ෂිත වනයක පරිපාලනය සහ කළමනාකරණය හා සම්බන්ධව මේ ආඥා පනතේ විධි විධානවලට හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක විධිවිධානවලට අනුකූලව නීත්‍යානුකූලව කරන යම් ක්‍රියාවක් තහනම් කෙරෙන සේ නොසැලකිය යුතු ය.".

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තියේ "15 වන වගන්තිය යටතේ සාදන ලද යම් නියෝගයක් කඩ කරන සෑම තැනැත්තෙක්ම රුපියල් සියයකට වැඩි නොවන දඩයකින් හෝ මාස හයක් දක්වා දීර්ඝ විය හැකි බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කරනු ලැබිය හැකි වරදකට වරදකරු විය යුතු ය." යන වචන හා ඉලක්කම් වෙනුවට "15 වන වගන්තිය යටතේ වූ යම් නියෝගයක් කඩකරන සෑම තැනැත්තෙක්ම රුපියල් එක් දහසකට අඩු නොවන හා රුපියල් පන්දහසකට වැඩි නොවන දඩයකට හෝ මාස එකකට අඩු නොවන හා අවුරුදු එකකට වැඩි නොවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය." යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කිරීම.

9. 1982 අංක 13 දරන පනතින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම උපවගන්තියේ "රක්ෂිත වනය හෝ ග්‍රාමීය වනයකට ඇතුළත් කොට නැති" යන වචන වෙනුවට "රක්ෂිත වනයකට හෝ සංරක්ෂිත වනයකට හෝ ග්‍රාමීය වනයකට ඇතුළත් කොට නැති" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එම උපවගන්තියේ (ඇ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්—

"(ඇ) නිවාස හෝ මඩු තැනීම, එම නිවාසවල හෝ මඩුවල පදිංචිවීම, ගල් කැඩීම හෝ කොරල් හෝ මොලියුස් ශිල්පිකටු ලබාගැනීම හෝ මිනිරන් හෝ මැණික්

සඳහා කැනීම හෝ පතල කැපීම, හුනුගල් හෝ අඟුරු පිලිස්සීම හෝ ගල් බෝර ගැසීම හෝ ඛනිජ ද්‍රව්‍ය සඳහා පොලොව හෑරීම විධිමත් කිරීම හෝ තහනම් කිරීම. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය සංශෝධනය කිරීම.

10. 1982 අංක 13 දරන පනතින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම වගන්තියෙහි "රුපියල් දහසකට වැඩි නොවන දඩයකින් හෝ මාස හයකට අඩු නොවන සහ අවුරුද්දකට වැඩි නොවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකින්" යන වචන වෙනුවට "රුපියල් දෙදහස් පන්සියයකට අඩු නොවන හා රුපියල් විසිපන්දහසකට වැඩි නොවන දඩයකින් හෝ අවුරුද්දකට අඩු නොවන හා අවුරුදු හතරකට වැඩි නොවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකින්" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) එම වගන්තියේ අතුරු විධානය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අතුරු විධානය ආදේශ කිරීමෙන්—

"20 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සාදන ලද යම් රීතියක් උල්ලංඝනය කරමින් යම් වනයකින් ගස් දැව බිම හෙලීම, කැපීම, ඉරීම, ස්වරූපය වෙනස් කිරීම හෝ ඉවත් කිරීම හෝ ගල් කැඩීම හෝ කොරල් හෝ මොලියුස් ශිප්පි කටු ලබා ගැනීම හෝ මිනිරන් හෝ මැණික් ලබා ගැනීම සඳහා කැනීම හෝ හෑරීම, හුනුගල් හෝ අඟුරු පිලිස්සීම, ගල් පිපිරවීම හෝ ඛනිජ ද්‍රව්‍ය සඳහා පොලව හෑරීම සිදු කරන යම් තැනැත්තෙක් වරදකට වරදකරු වන අතර, එසේ වරදකරු කරනු ලැබූ විට මාස හයකට අඩු නොවන සහ අවුරුදු හතරකට වැඩි නොවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට යටත් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය ඉවත් කිරීම.

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය සංශෝධනය කිරීම.

12. 1966 අංක 13 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ (ච) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් —

"(ජ) දැව, කැලෑ ගස් වර්ගවල බීජ සහ වෙනත් වන නිෂ්පාදන ආනයනය කිරීම සහ අපනයනය කිරීම විධිමත් කිරීම සහ එම කාර්ය සඳහා අවසරපත්‍ර නිකුත් කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම.";

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියේ "එම ඉඩමෙන් හෝ දේපලෙන් කපන ලද දැව ඇතුළත් වේ" යන වචන වෙනුවට "එම ඉඩමෙන් හෝ දේපලෙන් කපන ලද දැව ඇතුළත් වන අතර "කැලෑ ගස් වර්ග" යන්නෙන් I වන උපලේඛනයේ හෝ II වන උපලේඛනයේ සඳහන් ගස් වලින් යම් ගසක් සහ අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයක් මගින් කලින් කල නිශ්චිතව දක්වනු ලැබිය හැකි වෙනත් යම් ගස් ද අදහස් වේ" යන වචන ආදේශ කිරීමෙන්.

13. 1982 අංක 13 දරන පනතින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියෙහි—

(අ) "රුපියල් දෙසීයකට අඩු නොවන හා රුපියල් එක් දහසකට වැඩි නොවන දඩයකින්" යන වචන වෙනුවට "රුපියල් පන්දහසකට අඩු නොවන හා රුපියල් පනස්දහසකට වැඩි නොවන දඩයකින්" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) එම උපවගන්තියෙහි දෙවන අතුරු විධානයේ "රුපියල් දෙසීයකට අඩු නොවන හා රුපියල් දෙදහසකට වැඩි නොවන දඩයකින් හෝ මාස තුනකට අඩු නොවන සහ අවුරුදු එකකට වැඩි නොවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකින්" යන වචන වෙනුවට "රුපියල් දසදහසකට අඩු නොවන හා රුපියල් ලක්ෂයකට වැඩි නොවන දඩයකින් හෝ මාස හයකට අඩු නොවන හා අවුරුදු දෙකකට වැඩි නොවන කාලයක් සඳහා වූ බන්ධනාගාරගත කිරීමකින් හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකෙන් ම" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියෙහි—

"මාස තුනකට නොඅඩු හා අවුරුදු පහකට නොවැඩි කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකින්" යන වචන වෙනුවට "මාස හයකට නොඅඩු හා අවුරුදු පහකට නොවැඩි කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකින්" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) එම උපවගන්තියෙහි අතුරු විධානයෙහි " රුපියල් දෙසියයකට නොඅඩු හා රුපියල් එක් දහසකට නොවැඩි දඩයකට හෝ මාස තුනකට නොඅඩු හා මාස හයකට නොවැඩි කාලයක් සඳහා බන්ධනාගාර ගත කිරීමකට " යන වචන වෙනුවට " රුපියල් දෙදහස් පන්සියයකට නොඅඩු හා රුපියල් දස දහසකට නොවැඩි දඩයකට හෝ මාස තුනකට නොඅඩු හා අවුරුදු එකකට නොවැඩි කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම " යන වචන ආදේශ කිරීමෙන් ;

(3) එම වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්—

" (2අ) මේ වගන්තියේ ඉහතින්ම වූ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, (2) වන උපවගන්තියේ සඳහන් යම් තැනැත්තකු එහි සඳහන් යම් වරදකට වරදකරු කරනු ලැබූ අවස්ථාවක දී, තමා අයිතිකරු වන හෝ තම සන්තකයේ තිබූ යම් මෙවලමක්, බෝට්ටුවක්, කරත්තයක්, ගවයකු හෝ මෝටර් වාහනයක් එම වරද සිදු කිරීම සඳහා පාවිච්චි කිරීමට ඉඩ දුන් යම් තැනැත්තකු ද වරදකට වරදකරු වන අතර, එසේ වරදකරු කරනු ලැබීමේ දී රුපියල් දස දහසකට නොඅඩු හා රුපියල් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ මාස තුනකට නොඅඩු හා අවුරුදු දෙකකට නොවැඩි කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට යටත් විය යුතු ය. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය සංශෝධනය කිරීම.

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තියේ, " යම් බලපත්‍රයක් නිකුත් කිරීම " යන වචන වෙනුවට " යම් අවසර පත්‍රයක් නිකුත් කිරීම " යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය සංශෝධනය කිරීම.

15. 1982 අංක 13 දරන පනතින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තියේ (3) වන උපවගන්තියෙහි " රුපියල් පන්සියයකට නොඅඩු සහ රුපියල් එක් දහසකට නොවැඩි දඩයකට " යන වචන වෙනුවට " රුපියල් පන්දහසකට නොඅඩු හා රුපියල් පනස්දහසකට නොවැඩි දඩයකට " යන වචන ආදේශ කිරීමෙන් ;

(2) " මෝටර් වාහනය " යන වචනය එම වගන්තියේ ඇති සෑම අවස්ථාවක දී ම " මෝටර් වාහනය, ට්‍රේලරය, පහුරු, බත්තල හෝ යාන්ත්‍රික බලයෙන් ධාවනය වන හෝ නැති වෙනත් යම් ආකාරයක වාහනයක් " යන වචන ආදේශ කිරීමෙන්.

**16.** 1966 අංක 13 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තියේ (2) වන උපවගන්තියේ " එක් අවුරුද්දකට නොවැඩි කාලයක් සඳහා වූ බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් එක් දහසකට නොවැඩි දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දෙකටම " යන වචන වෙනුවට " මාස තුනකට නොඅඩු හා අවුරුදු එකකට නොවැඩි කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් පන්දහසකට නොඅඩු හා රුපියල් පනස් දහසකට නොවැඩි දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකට ම " යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය සංශෝධනය කිරීම.

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තියේ (2) වන උපවගන්තියේ " රුපියල් සියයකට නොවැඩි දඩයකින් හෝ මාස හයක් දක්වා දීර්ඝ විය හැකි බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ හැකි " යන වචන වෙනුවට " රුපියල් පන්දහසකට නොඅඩු හා රුපියල් ලක්ෂයකට නොවැඩි දඩයකින් හෝ මාස තුනකට නොඅඩු සහ අවුරුදු දෙකකට නොවැඩි කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ හැකි " යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තිය සංශෝධනය කිරීම.

18. ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තියෙහි " පාවිච්චි කරන ලද මෝටර් වාහනයක් " යන වචන වෙනුවට " පාවිච්චි කරන ලද මෝටර් වාහනයක්, ට්‍රේලරයක්, පහුරු, බත්තලක් හෝ මෝටර් ධාවනය ඇති අන්‍යාකාරයකින් වූ වෙනත් යම් ආකාරයක වාහනයක් සහ උපකරණ සහ යන්ත්‍ර " යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය සංශෝධනය කිරීම.

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 38අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 38අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

"37 වන වගන්තිය යටතේ අත් අඩංගුවට ගන්නා ලද ඇතැම් දේපළ නිදහස් කිරීම.

38අ (1) 37 වන වගන්තිය යටතේ අත් අඩංගුවට ගන්නා ලද (මේ වගන්තියෙහි සහ 42 වන වගන්තියෙහි " ඉදිරිපත් කළ භාණ්ඩ " යනුවෙන් සඳහන් කරනු ලබන) යම් උපකරණයක්, බෝට්ටුවක්, කරත්තයක්, ගවයෙක්, මෝටර් වාහනයක්, යන්ත්‍රයක්, පහුරක්, තෙප්පමක්, බත්තලක්, ට්‍රේලරයක් හෝ මෝටර් ධාවනය ඇති හෝ අන්‍යාකාරයකින් වූ වෙනත් යම් වාහනයක් අධිකරණයක් වෙත ඉදිරිපත් කරන ලද පසු ඕනෑම අවස්ථාවක, අවස්ථාචෝචිත පරිදි එම ඉදිරිපත් කළ භාණ්ඩයේ අයිතිකරු හෝ ලියාපදිංචි අයිතිකරු වෙත නිකුත් කරනු ලබන දැන්වීමක් මගින් එම දැන්වීමෙහි නිශ්චිතව දක්වනු ලැබිය හැකි කාල සීමාවක් තුළ එම භාණ්ඩයේ වටිනා

කමට සමාන මුදලක් ඇප වශයෙන් අධිකරණයේ තැන්පත් කිරීමේ දී, එම භාණ්ඩය, අවස්ථාවෝචිත පරිදි, එම අයිතිකරු හෝ ලියාපදිංචි අයිතිකරු වෙත මුදා හරින ලෙස අධිකරණය විසින් විධාන කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ අයිතිකරු හෝ ලියාපදිංචි අයිතිකරු වෙත මුදා හරින ලද යම් භාණ්ඩයක් 37 වන වගන්තිය යටතේ පසුව අත්අඩංගුවට ගනු ලැබුවේ නම් (1) වන උපවගන්තියෙන් නිශ්චිතව දක්වා ඇති ආකාරයට එම භාණ්ඩය එහි අයිතිකරු හෝ ලියාපදිංචි අයිතිකරු වෙත මුදා හරිනු ලැබිය හැකි ය.

(3) ඉදිරිපත් කර ඇති යම් භාණ්ඩයක් සම්බන්ධයෙන් හෝ එය භාවිතා කරමින් කැලෑ වරදක් කිරීම සම්බන්ධයෙන් වරදකරු වන යම් තැනැත්තකු එම භාණ්ඩයේ අයිතිකරු හෝ ලියාපදිංචි අයිතිකරු වුව ද එසේ නැති වුව ද, එම භාණ්ඩය නිදහස් කිරීම සඳහා (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය යටතේ ඇප මුදල් වශයෙන් අධිකරණයේ තැන්පත් කර ඇති යම් මුදලක් එම තැනැත්තා කැලෑ වරද සඳහා වරදකරු කරනු ලැබීමේ දී රාජසන්තක කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තිය සංශෝධනය කිරීම.

20. 1982 අංක 13 දරන පනතින් සංශෝධිත පරිදි වූ ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(ආ) (එම වරද සිදුකිරීමෙහි ලා ප්‍රයෝජනයට ගනු ලැබූ සියලුම උපකරණ, බෝට්ටු, කරත්ත, ගවයන්, මෝටර් වාහන, ට්‍රේලර්, පහුරු, බත්තල් හෝ මෝටර් ධාවනය ඇති හෝ අන්‍යාකාර වූ වෙනත් වාහන සහ සියලුම මෙවලම් සහ යන්ත්‍ර එම තැනැත්තාට අයත් වුව ද නැති වුව ද) ඒ සියලු උපකරණ, බෝට්ටු, කරත්ත, ගවයන්, මෝටර් වාහන, ට්‍රේලර්, පහුරු, බත්තල් හෝ මෝටර් ධාවනය ඇති හෝ අන්‍යාකාර වූ වාහන, මෙවලම් සහ යන්ත්‍ර.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තිය සංශෝධනය කිරීම.

21. 1966 අංක 13 දරන පනතින් සංශෝධිත පරිදි වූ ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තියේ "37 වන වගන්තිය යටතේ අත්අඩංගුවට ගනු ලැබ, ඉක්මණින් හා ස්වභාවික ලෙස දිරාපත්වී ඇති යම් දේපළක්" යන වචන වෙනුවට "37 වන වගන්තිය යටතේ අත්අඩංගුවට ගනු ලැබූ ඉක්මණින් හා ස්වභාවික

ලෙස දිරාපත් වී ඇති හෝ 38අ වගන්තිය යටතේ දේපළ අයිතිකරු හෝ ලියාපදිංචි අයිතිකරු වෙත මුදා හරිනු නොලැබූ යම් දේපළක් " යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

22. ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තියේ (1) වන උප වගන්තියේ " මාස හයක් දක්වා, දීර්ඝ විය හැකි කාලයක් සඳහා වූ බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් සියයක් දක්වා විය හැකි දඩ මුදලකට හෝ ඒ දෙකටම " යන වචන වෙනුවට " එක් අවුරුද්දකට නොවැඩි කාලයක් සඳහා වූ බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් එක් දහසකට නොවැඩි දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකට ම " යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය සංශෝධනය කිරීම.

23. 1966 අංක 13 දරන පනතින් සංශෝධිත පරිදි වූ ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තියේ " අවුරුදු දෙකක් දීර්ඝ විය හැකි කාලයක් සඳහා වූ බන්ධනාගාරගත කිරීමකට හෝ දඩයකට හෝ ඒ දෙකටම හෝ " යන වචන වෙනුවට " මාස හයකට අඩු නොවන හා අවුරුදු දෙකකට වැඩි නොවන කාලයක් සඳහා වූ බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් දස දහසකට අඩු නොවන හා රුපියල් පනස් දහසකට වැඩි නොවන දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකට ම හෝ " යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තිය සංශෝධනය කිරීම.

24. 1988 අංක 84 දරන පනතින් සංශෝධිත පරිදි වූ ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන වගන්තියේ (2) වන උපවගන්තියේ අතුරු විධානයේ " වන පාලකයකු විසින් හෝ අඩවි වන නිලධරයකු විසින් හෝ කරනු ලබන අවස්ථාවක, පොලිස් ස්ථානය භාර නිලධරයා මගින් හෝ ප්‍රාදේශීය ආදායම් නිලධරයා මගින්, මහෙස්ත්‍රාත්වරයා වෙත ඒ තැනැත්තා ඉදිරිපත් කිරීමේ දී අනිසි ප්‍රමාදයක් ඇතිවීමට ඉඩ තිබෙන බව ඒ වන පාලකගේ හෝ අඩවි වන නිලධරයාගේ මතය වන්නේ නම් ඒ වන පාලක හෝ අඩවි වන නිලධරයා විසින් ඒ තැනැත්තා කිට්ටුම මහෙස්ත්‍රාත් වෙත ඉදිරිපත් කළ හැකි ය. " යන වචන වෙනුවට " වන නිලධරයකු විසින් කරනු ලබන අවස්ථාවක පොලිස් ස්ථානය භාර නිලධරයා මගින් හෝ ප්‍රාදේශීය ලේකම්වරයා මගින් ඒ තැනැත්තා මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබීමේ දී අනිසි ප්‍රමාදයක් වීමට ඉඩ තිබෙන බව තමාගේ මතය වන්නා වූ අඩවි වන නිලධරයකුගේ ධුරයට පහළ නොවන නිලයක් දරන වන නිලධරයකු විසින්, ඒ තැනැත්තා කිට්ටුම මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය ". යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන වගන්තිය සංශෝධනය කිරීම.

25. ප්‍රධාන ප්‍රඥප්තියේ 48අ වගන්තියේ (1) වන උපවගන්තියෙහි වූ " අවුරුදු පහකට නොවැඩි වූ කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් පන් දහසකට නොවැඩි දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම හා දඩය යන දඬුවම් දෙකටම හෝ " යන වචන වෙනුවට " අවුරුදු එකකට නොඅඩු සහ අවුරුදු සතකට

ප්‍රධාන ප්‍රඥප්තියේ 48 අ වගන්ති සංශෝධනය කිරීම.

නොවැඩි කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් විසිපන්දහසකට නොඅඩු හා රුපියල් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 49අ වගන්තිය සංශෝධනය කිරීම.

**26.** 1988 අංක 84 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 49අ වගන්තියේ "රුපියල් දෙදහසකට නොඅඩු වූ ද රුපියල් පන්දහසකට නොවැඩි වූ ද දඩයකට" යන වචන වෙනුවට "රුපියල් පනස් දහසකට නොඅඩු වූ ද රුපියල් එක් ලක්ෂ පනස් දහසකට නොවැඩි වූ ද දඩයකට" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 53අ, වගන්තිය කිරීම.

**27.** ප්‍රධාන ප්‍රඥප්තියේ 53අ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(අ) "මේ ආඥාපනතේ 7 වන වගන්තිය හෝ 14 වන වගන්තිය හෝ 20 වන වගන්තිය යටතේ" යන වචන හා ඉලක්කම් වෙනුවට "මේ ආඥාපනතේ 7 වන වගන්තිය හෝ 7අ වගන්තිය හෝ 14 වන වගන්තිය හෝ 20 වන වගන්තිය යටතේ" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ආ) "එම ඉඩමෙන් නෙරපනු ලැබීමට යටත් විය යුතු ය." යන වචන වෙනුවට "එම ඉඩමෙන් නෙරපනු ලැබිය යුතුය." යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 55 වන වගන්තිය සංශෝධනය කිරීම.

**28.** ප්‍රධාන ප්‍රඥප්තියේ 55 වන වගන්තියේ (අ) (ආ) සහ (ඇ) යන ඡේද වෙනුවට පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

| | රු. ශත |
|---|---|
| (අ) එක් එක් ඇතා හෝ මීහරකා සඳහා | 5,000.00 |
| (ආ) එක් එක් වසු පැටියකු, බූරුවකු, ඌරකු, බැටළුවකු, බැටළු පැටවකු, එළුවකු හෝ එළු පැටවකු සඳහා ... ... | 2,500.00 |
| (ඇ) ඉහත සඳහන් සතුන් හැර එක් එක් ගවයකු සඳහා ... ... | 5,000.00 |

ප්‍රධාන ප්‍රඥප්තියට 59අ සහ 59ආ අලුත් වගන්ති ඇතුළත් කිරීම.

**29.** 59 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්ති ප්‍රධාන ප්‍රඥප්තියේ 59අ සහ 59ආ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:—

"වන සංරක්ෂක විසින් බලතල පැවරිය හැකි බව.

59අ. මේ ආඥාපනත මගින් හෝ එය යටතේ සාදන ලද යම් නියෝගයක් මගින් හෝ වන සංරක්ෂකවරයා වෙත සතු කර ඇති හෝ යථා පරිදි පවරන ලද බලතල ඔහු විසින් යම් වන නිලධරයකු වෙත ලිඛිතව පවරනු ලැබිය හැකි ය.

වන සංරක්ෂකවරයා විසින් දෙනු ලබන සාමාන්‍ය විධාන.

59ආ. මේ ආඥාපනත යටතේ හෝ එය යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ ස්වකීය කාර්යයන් ඉටු කිරීමේ දී 58 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද සියලු වන නිලධරයන් සහ 58 වන වගන්තියේ (2) වන උප වගන්තිය යටතේ වන නිලධරයන්ගේ කර්තව්‍ය ඉටු කිරීමට බලය පවරන ලද සේවකයන් සහ නිලධරයන් වන සංරක්ෂකවරයාගේ සාමාන්‍ය විධානයට හා පාලනයට යටත් විය යුතු ය."

30. ප්‍රධාන ප්‍රඥප්තියේ 60 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ සඳහා පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 60 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

වන නිලධරයන් රජයේ නිලධරයන් සහ සාම නිලධරයන් ලෙස සැලකිය යුතු බව.

60. සියලුම වන නිලධරයන්—

(අ) දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව රජයේ නිලධරයන් ලෙස ද ;

(ආ) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අර්ථානුකූලව සාම නිලධරයන් ලෙස ද

සලකනු ලැබිය යුතු ය.".

31. 1988 අංක 84 දරන පනත මගින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 78 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 78 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ "ගවයන්" යන යෙදුමේ අර්ථ කථනයට පෙරාතුව ම පහත දැක්වෙන අලුත් අර්ථකථනය ඇතුළත් කිරීමෙන් :—

"සතා" යන්නට කොඳු ඇට පෙළ සහිත හෝ කොඳු ඇට පෙළ රහිත යම් සත්වයකු අදහස් වන අතර ඊට යම් කුරුල්ලකු, මාලුවකු හෝ උරගයකු ද ඇතුළත් වේ; ";

(2) එම වගන්තියේ "වර්ගීකරණ සලකුණ" යන යෙදුමේ අර්ථ කථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථකථනය ඇතුළත් කිරීමෙන් :—

"සංරක්ෂිත වනය" යන්නෙන් 3අ වගන්තිය යටතේ සංරක්ෂිත වනයක් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබූ රජයේ ඉඩමක යම් නිශ්චිත ප්‍රදේශයක් හෝ යම් රක්ෂිත වනයක් සම්පූර්ණයෙන්ම හෝ එහි යම් නිශ්චිත ප්‍රදේශයක් අදහස් වේ; ";

(3) "වන නිලධාරී" යන යෙදුමේ අර්ථකථනය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ කථනය ආදේශ කිරීමෙන් :—

"වන නිලධාරී" යන්නෙන් වන සංරක්ෂකවරු, අතිරේක වන සංරක්ෂකවරු, නියෝජ්‍ය වන සංරක්ෂකවරු, සහකාර වන සංරක්ෂකවරු, දිසා වන නිලධරයන්, අතිරේක දිසා වන නිලධරයන්, වන පාලකයන්, අඩවි වන නිල

ධරයන්, අතිරේක අඩවි වන නිලධරයන්, වන ඕවර්සියර්වරුන්, බිට්ටු වන නිලධාරීන්, වන නියාමකයන්, වන මුරකරුවන්, වන කම්කරුවන් සහ මේ ආඥා පනත යටතේ හෝ එය යටතේ සාදන ලද යම් නියෝගයක කර්තව්‍ය ඉටු කිරීමට නමින් හෝ ධුරයෙන් පත් කරන ලද වෙනත් යම් තැනැත්තෙක් ද අදහස් වේ;";

(4) "රජයේ කැමැත්ත පරිදි බැහැර කළ හැකි ඉඩම්" යන්නෙහි අර්ථ කථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ කථනය ඇතුළත් කිරීමෙන් :—

"ශාකය" යන්නෙන් ළඵවවු වර්ගවල යම් සාමාජිකයකු අදහස් වන අතර ඊට යම් ශාකයක ඇට හෝ වෙනත් යම් කොටස් අදහස් වේ;";

(5) "ගස" යන්නෙහි අර්ථ කථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථකථනය ඇතුළත් කිරීමෙන් :—

"වන සත්වයා" යන්නෙන් ගෘහස්ථ සතකු නොවන ඕනෑම සතකු අදහස් වේ".

ප්‍රධාන ප්‍රඥප්තියේ I වන උපලේඛනය ප්‍රතියෝජනය කිරීම.

32. ප්‍රධාන ප්‍රඥප්තියේ I වන උපලේඛනය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කරනු ලැබේ:—

I වන උපලේඛනය (13 වන වගන්තිය)

| සිංහල නම | | දෙමළ නම | | උද්භිද විද්‍යාත්මක නම |
|---|---|---|---|---|
| ඇලෙක්සියා | ... | ඇලෙක්සියා | ... | ඇලෙක්සයා ඔවිසිවුලා පෝමීස් |
| ඇලෙක්සියා | ... | ඇලෙක්සයා | ... | ඇලෙක්සයා මැන්ජියම |
| අරළු | ... | කඩුක්කායි | ... | ටර්මිනේලියා චෙබියුලා |
| බෙලි | ... | විල්වම් | ... | ඊගල් මාර්මලෝස් |
| බුලු | ... | තන්රි මරම් | ... | ටර්මිනේලියා බෙලරිකා |
| බුරුත | ... | මුටරායි | ... | ක්ලෝරොක්සිලෝන් ස්විටෙනියා |
| දෙල්, බැදි දෙල් | ... | අයිනිප්පිලා හෝ අන්පිලි මාරම් | ... | ආටොකාපස් නොබිලිස් |
| දිවිකදුරු | ... | කන්ඩලායිපලම් | ... | පැජියන්තා ඩයිකොටෝමා |
| දිවුල් | ... | නිලාවිලා | ... | සිමෝනියා ඇසිඩසිමා |
| දොඹ | ... | පුන්නෙයි | ... | කැලෝෆයිලම් ඉනෝෆයිලම් |
| දුන් | ... | කුන්ගිලිය මරම් | ... | ඩූනා සිලැනිකා |
| එලකඩොල් | ... | කන්ඩල් | ... | රයිසෝෆෝරා මියුක්‍රොනේටා |
| ඇත්දෙමට | ... | කුම්ල මරම් | ... | ටෙලිනා අබෝරියා |
| යුකැලිප්ටස් | ... | සන්තිව | ... | සියලු යුකැලිප්ටස් වර්ග |
| ගම්මාලු | ... | වෙන්ගෙයි | ... | ටෙරෝකාපස් මාසුපියම් |
| ග්ලිරිසිඩියා | ... | සිමෙයි කිලුවයි | ... | ග්ලිරිසිඩියා සෙපියම් |
| හල්මිල්ල | ... | චවන්ඩලායි | ... | බෙරියා කෝඩිෆෝලියා |
| හුලන්හික් | ... | අග්ලායි හෝ කලෝරි | ... | චුක්රේෂියා වෙලූටිනා |
| ඉපිල් - ඉපිල් | ... | ඉපිල් | ... | සියලු ලියුකේනා වර්ග |
| කඩොල් | ... | කන්ඩල් | ... | රයිසෝෆෝරා ඇපිකියුලේටා |

| සිංහල නම | දෙමළ නම | උද්භිද විද්‍යාත්මක නම |
|---|---|---|
| කළුමැදිරිය | පතුරන්කලි | ඩයොස්පයිරස් කොයිටා ඩයොස්පයිරස් ඔපසිට් ෆෝලියා |
| කලුවර | කරුක්කාලි | ඩයොස්පයිරස් එබෙනම් |
| කය | සවුක්කු | කැසුවරිනා ඉක්විසෙටි ෆෝලියා |
| කීනා | | කැලෝෆයිලම් ටොමෙන්ටෝසම |
| කීනා | | කැලෝෆයිලම් වෝකරි |
| කිරල | කින්න | සොනරේෂියා කැසියෝලරිස් |
| කොහොඹ | වෙටබු | ඇසඩිරච්ටා ඉන්ඩිකා |
| කොස | පිලා | ආටොකාපස් හෙටරොෆයිලස් |
| කුඹුක් | මරදු | ටර්මිනේලියා අර්ජුන |
| ලුණු මිදෙල්ල | මලයිවෙටබු | මෙලියා ඩුබියා |
| මල්කොඩොල් | සියපකොත්තදම් | බරුගේරා ජිමෝරිසා |
| මල්බාර | මයරිම | ඩෙලොනික්ස් රෙජියා |
| මොන්ඩෝරා | | වටිකා වයිනිසිස් |
| මී | ඉළුප්පයි | මධුකා ලොන්ගිෆෝලියා |
| මිල්ල | කාටාමනක්කු හෝ මයිලාල් | වයිටෙක්ස් ඇල්ටිසිමා |
| මිදෙල්ල | කඩම්බු | බැරින්ටෝනියා ඒෂියාටිකා |
| නා | නාක | මෙසුආ ෆෙරියා |
| නැදුන් | | පෙරිකෝප්සිස් මූනියානා |
| නෙල්ලි | නෙල්ලි | ෆිලැන්තස් එම්බ්ලිකා |
| පලු | පාලෙයි | මනිල්කාර හෙක්සැන්ඩ්‍රා |
| පිහිඹියා | සින්නිරෙයි වෙම්බු | ෆලිසියම් ඩෙසිෂියන්ස් |
| පයින් | පයිනස් | සියලු පයිනස් වර්ග |
| පිනිමාර | ඉනල්වාගෙයි | සමනියා සමන් |
| පුන් කරඳ | සිරුකන්දල් | සෙරියෝප්ස් ටගාල් |
| රුක් අත්තන | ඊලිලෙයි පාලෙයි | අලටෝනියා ස්කොලැරිස් |
| සපු, හපු ගිනිසපු | මන්පකම් | මයිකේලියා චම්පකා |
| සියඹලා | පුලි | ටැමරින්ඩස් ඉන්ඩිකස් |
| සූරිය මාර | පොන්නෙයි මුරින්ගෙයි | අල්බිසියා ඔඩරැටිසිමා |
| වටනා | වටපානෙයි | මිස්කොඩෝන් සෙල තික්ස් |
| තේක්ක | තේක්කු | ටෙක්ටෝනා ග්‍රෑන්ඩිස් |
| වල් ඇහැල | වෙන්ගයි | ටෙරොකාපස් ඉන්ඩිකස් |
| වල් සපු හෝ වල් බුරුත | | මයිකේලියා නිලාගිරිකා |
| වැවරණ | රනයි හෝ සාවරනයි හෝ අයිලවානෙයි | පෙල්ටොෆොරම් ටෙරොකාපම් |

33. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වුවහොත් සිංහල භාෂා පාඨය බල පැවැත් විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත් වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි (විදේශීය) රු. 1.160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01. රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන [illegible] වර්ෂය සඳහා [illegible] හැකිය.